Bs Accounting O/L

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

60 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2011 ජුලි
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2011

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II
வணிகக் கல்வியும் கணக்கீடும் I , II
Business and Accounting Studies I , II

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලුව සියලු ම ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

---

01. සුරේන් විශ්‍රාමික රාජ්‍ය නිලධාරියෙකි. දිනක් ප්‍රිය සම්භාෂණයක දී ඔහුගේ හොඳම පාසල් මිතුරිය වන සුරනි විශ්‍රාමික බැංකු කළමණාකාරිනිය හමුවිය. එහිදී ඇති වූ කතා බහක කොටසක් පහත දැක්වේ...

සුරේන් - ආ......... මම ගිය මාසේ විශ්‍රාම ගියා.. රු. 1,000,000 ක් ලැබුණා. බැංකු පොලියත් 5% යි. කිසිම වැඩක් නෑ....... මොකක් හරි ව්‍යාපාරයක් පටන් ගන්නයි හිතා ගෙන ඉන්නේ .....

සුරනි - මමත් ලබන මාසේ විශ්‍රාම යනවා. රු. 1,500,000 ක් පමණ මට ලැබෙයි...
මමත් කැමති ව්‍යාපාරයකට .... රැකියා කරලා එපා වෙලා .....................

සුරේන් - මේ දවස් වල බැංකු පොලි අනුපාතය අඩු වෙලා නිසා මිනිස්සු ඉඩම් මිලදී ගන්න පටන් අරන්....
ඉඩම් අරගෙන විකුණන එක් හොඳ ව්‍යාපාරයක්...

සුරනි - ඔයාට මතක ද සුරත් ව.... එයා ගාව රු. 1,500,000 ක ඉඩමක් තියෙනවා.....
එයත් සම්බන්ධ වෙන්න කැමතියි....

මොවුන් තිදෙනාම පමණක් එකතු වී 2011.04.01 දින ඔවුන්ගේ වගකීම ප්‍රාග්ධනයට පමණක් සීමා වන සේ අවම ලියවිලි යටතේ ඉඩම් කට්ටි කොට විකුණන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. සුරත් විසින් ව්‍යාපාරයට යෙදූ ඉඩම අප තබා බැංකුවෙන් 10% වාර්ෂික පොලියට රු. 1,000,000 ක ණයක් ලබා ගන්නා ලදි. වාර්ෂික තොරතුරු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ලී බඩු උපකරණ මිලට ගත්තා | රු. 200,000 | ඉඩම් මිලදී ගැනීම | රු. 8,800,000 |
| ඉඩම් විකුණුම් | රු. 11,000,000 | වැටුප් | රු. 50,000 |
| අමතර වියදම් | රු. 30,000 | වාර්ෂික බැංකු පොලිය | ....................................... |
| දුරකථන ගාස්තු | රු. 15,000 | මිනින්දෝරු ගාස්තු | රු. 10,000 |
| විදුලිය | රු. 8,000 | ගෙවල් කුලී | රු. 60,000 |
| වරිපනම් | රු. 7,000 | ණය වාරික ගෙව්වා | රු. 200,000 |

01. "බැංකු පොලි අනුපාතිකය පහල යන විට ඉඩම් වල මිල ඉහල යයි." මෙය පැහැදිලි කරන්න.
02. මොවුන්ට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
03. මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය හැඳින්වීමේ දී නමට යෙදිය යුතු විශේෂ පද ආදියක් වේ නම් ඒවා නම් කරන්න.
04. මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය ලියාපදිංචි කල යුතු පණත නම් කරන්න.
05. ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියවිලි 2ක් ලියන්න.
06. මෙම ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කීයද ?
07. සුරත් විසින් ලබා ගත් බැංකු ණයෙහි වාර්ෂිකව ගෙවිය යුතු පොලිය කොපමණ ද?
08. මෙහි වාර්ෂික මුළු වියදම ගණනය කරන්න.
09. වාර්ෂික ලාභය කීයද?
10. යෙදූ ප්‍රාග්ධනයට ලාභ ප්‍රතිශතය කීයද

(ලකුණු 02 x 10 = 20 යි)

හයවන පිටුව බලන්න

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

### (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න)

02. (i) රටක ළමා ජනගහනය ඉහල යාම නිසා ඇතිවිය හැකි ව්‍යාපාර අවස්ථා 4 ක් ලියන්න.
    (ii) බාහිර පරිසරය අධ්‍යයනය තුලින් හඳුනා ගත් තර්ජන 2 ක් ලියන්න.
    (iii) නිෂ්පාදකයා භාණ්ඩ බෙදාහරින ප්‍රධාන ක්‍රම 4ක් ලියන්න.
    (iv) ප්‍රාථමික නිෂ්පාදනය බෙදන ප්‍රධාන කොටස් මොනවාද?
    (v) W5 රාමුව නම් කරන්න.

(ලකුණු 02 x 05 = 10 යි)

03. (i) වර්තමාන ව්‍යාපාර බොහෝ දුරට සමාජ සුභසාධනය කෙරෙහි යොමු වෙමින් පවති. එයට හේතු මොනවාද ?
    (ii) බලපත්‍රලාභි වාණිජ බැංකුවක් යනු කුමක්ද?
    (iii) ප්‍රධාන රක්ෂණ මූලධර්ම නම් කර ඉන් ජිවිත රක්ෂණය සඳහා බලනොපාන මූලධර්මය පැහැදිලි කරන්න.
    (iv) ණයපතක් නිකුත් කිරිමෙන් බැංකුවට ඇති වාසි 2ක් සඳහන් කරන්න.
    (v) ව්‍යාපාර සංවිධාන වර්ග කෙරෙන ප්‍රධාන පදනම් 2 කුමක්ද?

(ලකුණු 02 x 05 = 10 යි)

## II කොටස - ගිණුම්කරණය

### (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න)

04. (i) පහත සඳහන් තොරතුරු ඇසුරෙන් මෙහෙයුම් සැලැස්මක් පිලියෙල කොට ඒකක නිෂ්පාදන පිරිවැය සොයන්න.

| | | | |
|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | 14,000 | සෘජු ශ්‍රමය | 8,000 |
| වක්‍ර ද්‍රව්‍ය | 9,000 | වක්‍ර ශ්‍රමය | 12,000 |
| සෘජු වෙනත් | 2,000 | වක්‍ර වෙනත් | 1,000 |

නිෂ්පාදන ඒකක ගණන 1000

(ලකුණු 2.5 යි)

(ii) පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

1. බැංකු ණයක් ගත්තා රු. 30,000 යි.
2. අත්පිට විකුණුම් රු. 12,000 යි.
3. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගත්තා රු. 3,000 යි.
4. රු. 500,000 ක මෝටර් රථය අයිතිකරු ව්‍යාපාරයට යෙදුවා.
5. ගමන් ගාස්තු ගෙව්වා රු. 2,000

(ලකුණු 2.5 යි)

(iii) චලනගේ ව්‍යාපාරයේ 2011 ජනවාරි මාසයේ මුදල් පොතේ බැංකු තීරුව හා එදින ලද බැංකු ප්‍රකාශණයේ සාරාංශයක් පහත දැක්වේ.

**මුදල් පොත**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 12,000 | අශේන් (චෙ. අ. 931) | 1,500 |
| කසුනි (චෙ. අ. 60) | 2,500 | තිවංක (චෙ. අ. 932) | 9,100 |
| මලිත් (චෙ. අ. 110) | 7,100 | සදලිකා (චෙ. අ. 933) | 5,300 |
| කුසුම් (චෙ. අ. 211) | 6,900 | උදාර (චෙ. අ. 934) | 2,100 |
| | | ශේෂය ප/ගෙ | 10,500 |
| | 28,500 | | 28,500 |

**බැංකු ප්‍රකාශණය**

| විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| ශේෂය | | | 12,000 |
| චෙ. අ. 110 (මලිත්) | | 7,100 | 19,100 |
| චෙ. අ. 932 (තිවංක) | 9,100 | | 10,000 |
| චෙ. අ. 211 (කුසුම්) | | 6,900 | 16,900 |
| චෙ. අ. 934 (උදාර) | 2,100 | | 14,800 |
| චෙ. අ. 933 (සදලිකා) | 5,300 | | 9,500 |
| ලාභාංශ | | 500 | 10,000 |
| රක්ෂණය | 5,000 | | 5,000 |
| නුවන් (චෙක්පත) | | 1,500 | 6,500 |
| චෙක්පොත් ගාස්තු | 3,000 | | 3,500 |
| බැංකු ගාස්තු | 4,000 | | - (500) |

**ඔබ විසින්,**

1. 2011 ජනවාරි මස 31 දිනට සංශෝධිත මුදල් පොත.
2. 2011 ජනවාරි මස 31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න.

*(ලකුණු 05 යි)*

*(ලකුණු 10 යි)*

05. 1. පහත දැක්වෙන්නේ 2010.12.31 දිනට වත්කම් වගකීම් ශේෂ කිහිපයකි. ඒවා පොදු ජ'නලයේ සටහන් කර ප්‍රග්ධනය සොයන්න.

| | |
|---|---|
| ඉඩම් | 610,000 |
| මෝටර් රථ | 430,000 |
| ණයහිමියෝ | 280,000 |
| අතති මුදල් | 110,000 |
| ණයගැතියෝ | 80,000 |
| බැංකු ශේෂය | 40,000 |

*(ලකුණු 05 යි)*

2. තත්සරගේ ව්‍යාපාරයේ 2011 ජුනි මාසයේ සිදුවූ සුළු වියදම් ගනුදෙනු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ජුනි 01 | ඉදිරියට ගෙන ආ සුළු මුදල් ශේෂය | 880 |
| | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | 120 |
| ජුනි 02 | ගමන් වියදම් ගෙව්වා | 55 |
| 08 | විදුලි පණිවුඩ ගාස්තු | 45 |
| 11 | තරිඳු ට ගෙව්වා | |
| 14 | මුද්දර ගත්තා | 40 |
| 15 | වැටුප් අත්තිකාරම් | 120 |
| 18 | සංග්‍රහ ගාස්තු ගෙව්වා | 30 |
| 22 | අභ්‍යාස පොතක් ගත්තා | 50 |
| 27 | ගෙනඒමේ කුලි | 110 |
| 28 | පරිත්‍යාග | 80 |
| 29 | ටැක්සිකුලි ගෙව්වා | 100 |
| 30 | අත ඉතිරි සුළු මුදල් ශේෂය | 190 |
| | අග්‍රිමය ප්‍රතිපූරණය කලා | |

ගමන්, ලිපිද්‍රව්‍ය, තැපල් හා විවිධ යන විශ්ලේෂණ තිරු සහිත සුළු මුදල් පොතක ඉහත ගනුදෙනු වාර්තා කරන්න.

*(ලකුණු 05 යි)*

*(ලකුණු 10 යි)*

**සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක**

**සිසිර කුමාර විසින් සම්පාදිත යි.**